**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2026.03.04
වේලාව :- පෙ.ව. 10.00

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
18. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
19. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
20. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
21. පී.ජී.මල්ලිකා මැතිතුමිය
22. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
23. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
24. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
25. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
26. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
27. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
28. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
29. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
30. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
31. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
32. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
33. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
34. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහභාගිත්වය**

- ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

(අ). 2026.02.03 දින පැවති මාසික මහසභා වාර්තාව සම්මත කිරීම.
(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන
(ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා
(ඈ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම
(ඉ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත
(ඊ). යථාපරිදි කල්දී ඇති යෝජනා
(උ).කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම. -නැත
(ඌ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.
(එ).සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම.

**(අ).2026.02.03 දින පැවැති මාසික මහසභා වාර්තාව සම්මත කිරීම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.02.03 දින පැවැත්වූ මාසික මහසභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2026.02.03 දින පැවැත්වූ මාසික මහසභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

වාර ගණනාවක්ම මාධ්‍යවේදීන් සභාව ආවරණය කිරීමට නොපැමිණි බවත් ප්‍රකාශ කළ අතර ඔවුන්ව දැනුවත් කිරීම සිදු නොකළේ ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සෑම මසකම මාසික හෝ විශේෂ සභා පැවැත්වීම සම්බන්ධව සභික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා දැනුවත් කරන මොහොතේදීම මාධ්‍ය ආවරණය සලසා දෙන ලෙස එතුමන්ලාට ද ලිඛිත ලිපි ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.

**සංශෝධන**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 37 හි ඊ.II.06 යෝජනාව සම්බන්ධව මන්ත්‍රීවරුන් දෙපළක් විරුද්ධත්වය ප්‍රකාශ කර ඇති නමුත් අදාල යෝජනාව සභා සම්මත විය ලෙස සටහන් වීම ගැටලු සහගත බව සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විරුද්ධත්වයක් පවතීද යන්න විමසන විට සභික මණ්ඩලය විසින් බෙදීමකට හෝ ඡන්දයකට යා යුතු බවට ඉල්ලීමක් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. තවද, සංශෝධනය ඉදිරිපත් කරන අවස්ථාවේදී නොව අදාල යෝජනාව සභා සම්මත කරන අවස්ථාවේදී මෙම ප්‍රශ්නය නැගිය යුතුව තිබූ බවත් වාර්තා ගත කරනු ලබන්නේ එදින ඒ මොහොතේ සිදුවූ දේ පමණක් බවත් වැඩිදුරට ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටලුවක් පවතීද යන්න විමසන ලදී ලෙස සටහන් වුවද එදින මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාපතිතුමන් විසින් මෙම ප්‍රකාශය ඉදිරිපත් නොකළ බව සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

**සටහන,**

- 20 (17) රීතිය අනුව සභාවට ඉදිරිපත් වන යෝජනාවක් ස්ථිර කරනු ලැබ විවාදය අවසන් වීමෙන් පසු මූලාසනය විසින් යෝජනාවට අදාළව සභාවේ එකඟතාවය විමසිය යුතු අතර එසේ එකඟතාවය විමසීමේදී කිසියම් සභිකවරයෙකු යෝජනාවට අදාළව බෙදීමක් ඉල්ලා නොසිටියේ නම් අදාළ යෝජනාව සභාව විසින් යථා පරිදි සම්මත වූ යෝජනාවක් ලෙස සැලකිය යුතු බව දක්වා ඇති බවත්,

- 20 (18) රීතිය අනුව යෝජනාවකට අදාළව සභාවේ එකඟතාවය විමසීමේදී කිසියම් සභිකවරයෙකු යෝජනාවට අදාළව බෙදීමක් ඉල්ලා සිටියේ නම් යෝජනාව සම්බන්ධයෙන් ඡන්දය විමසීමට ක්‍රියාකළ යුතු බවත්ය.

ඉහත රීති අනුව කටයුතු කළ බවත් එදින මෙම යෝජනාව සම්බන්ධයෙන් එවැනි බෙදීමක් නොඉල්ලූ බවත් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පිටු අංක 24 හි ඊ.02 යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේදී කමිටු යෝජනාවක් අදාළ මන්ත්‍රීතුමන්ට පෞද්ගලිකව යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ හැකිද යන්න විමසූ බවත්, ඊට පිළිතුරු ලබා දුන්නේ ඔබතුමන් නොවන බවත්, එම ප්‍රකාශය වාර්තවේ ඇතුළත් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

2026.03.04 දින මහසභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරන ලදී.

**(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදනය**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

01. ලංකා විදුලිබල මණ්ඩලයෙන් 2026/02/19 දින එවන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.එහි පහත කරුණු පිළිබඳ දැඩි අවධානමක් යොමු කළ යුතු බව දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදී.

- ✓ අනවසර විදුලි පහන් ඉවත් කර ගන්නා ලෙසත්,
- ✓ විදුලි සේවා රැහැන් පළුදු වීම මත අනාරක්ෂිත භාවයක් ඇති වන බවත්,
- ✓ ඉදිරියේදී විදී පහන් සවි කරන්නේ නම් විදුලි බල මණ්ඩලයෙන් අවසර ගත යුතු බවත්ය.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

වීදි පහන් සවි කිරිමේදී විදුලි බල මණ්ඩලයෙන් අවසර ගත යුතු ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලංකා විදුලිබල මණ්ඩලයෙන් එවා ඇති ලිපිය ඉදිරිපත් කල බවත්, ඒ අනුව කටයුතු කළයුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

02. විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන "රටම එකට ජාතික මෙහෙයුම් වැඩසටහන" නමින් ලිපියක් 2026.02.23 දින රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ විසින් එවා ඇති බවත්, එය සභාවට ඉදිරිපත් කළ අතර පහත කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු බව දන්වන ලදී.

- ✓ අලෙවිය හා බෙදා හැරීම පාලනය
- ✓ ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය
- ✓ පාසල් ළමුන් දැනුවත් කිරීම ... ආදිය සඳහා විෂ මත්ද්‍රව්‍ය නිවාරණ සතියක් නම් කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

**(ඇ).සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමාගේ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමියගේ නිවාඩු ලබා ගැනිම පිළිබඳ නිවේදන ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදි. සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. අසනිප බැවින් 2026.03.04 දින පැවැත්වෙන මහසභාවට සහභාගි විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2026.03.04 දින පැවැත්වෙන මහසභාවට ගරු ප්‍රාදේශීය සභා

මන්ත්‍රී එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමාට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබාදීම සුදුසු බවට ගරු මහසභාව විසින් අනුමත කරන ලදි.

ii. අසනීප බැවින් 2026.03.04 දින පැවැත්වෙන මහසභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2026.03.04 දින පැවැත්වෙන මහසභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමාට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබාදීම සුදුසු බවට ගරු මහසභාව විසින් අනුමත කරන ලදි.

iii. හදිසි අනතුරකින් රෝහල් ගත වී සිටින බැවින් 2026.03.04 දින පැවැත්වෙන මහසභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2026.03.04 දින පැවැත්වෙන මහසභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබාදීම සුදුසු බවට ගරු මහසභාව විසින් අනුමත කරන ලදි.

**(ඇ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

යපා බණ්ඩාර රන්දෙණිය,දෙල්දෙණිය මාර්ගයේ වම්පස ඇති කාණු පද්ධතිය හා ඇළ ගොඩ වී ඇති බැවින් බැකෝ යන්ත්‍රය යොදා සංවර්ධන කර දෙන ලෙස ඉල්ලා සංදේශයක් ඉදිරිපත් කර ඇති බවත්,එය සභාවට ඉදිරිපත් කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කාර්මික නිලධාරීන් යොදවා ස්ථානීය පරීක්ෂාවක් සිදුකළ යුතු බවත්, ඔවුන්ගේ වාර්තාව අනුව ඉදිරි පියවර ගතයුතු බවත් ප්‍රකාශ කළ අතර තවද, මෙම මාර්ගයේ ජලනළ එළිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බවත්, එමඟින් ද මෙම කාර්ය සිදුකර ගතහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

**(ඊ).01.I.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

i. නව වෙළෙඳ සංකීර්ණයේ පිහිටි වැසිකිළි පද්ධතියේ බැහැර වන අප ජලය පිරිපහදු කර මුදා හැරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

නව වෙළෙඳ සංකීර්ණයේ පිහිටි වැසිකිළි පද්ධතියේ බැහැර වන අප ජලය පිරිපහදු කර මුදා හැරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීමට තීරණය විය.

ii. මෙම සභාව සතු පොදු වෙළෙඳපළ II අදියර අංක 18 කඩ කාමරය P.M.R.S.ප්‍රියමාල් දසනායක මහතා විසින් බදුගෙන ඇති අතර ඒ සඳහා 2010.09.27 දින ගිවිසුම් අත්සන් කර ඇත. ඔහු විසින් එම කඩ කාමරයේ බදු අයිතිය තම බිරිඳට පවරා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති අතර ප.පා.කො.01/2023 හා 2023.05.01 දිනැති චක්‍රලේඛය පරිදි පවරා දීමට අවශ්‍ය මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
සභාදේපළ මන්ත්‍රීවරයකුට පරිහරණය කිරීම සිදුකළ නොහැකි බැවින් බිරිඳට පැවරීමට අනුමැතිය ඉල්ලා ඇති බව ප්‍රකාශ කරන ලදී.
❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
මන්ත්‍රීවරයකු සභාදේපළ පරිහරණය කළ හොත් අධිභාරයකට ලක්වන බව ප්‍රකාශ කරන ලදී.
❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මෙම සභාව සතු පොදු වෙළෙඳපළ II අදියර අංක 18 කඩ කාමරය P.M.R.S.ප්‍රියමාල් දසනායක මහතා විසින් බදුගෙන ඇති අතර එම කඩ කාමරයේ බදු අයිතිය ඔහුගේ බිරිඳට පවරා දීමට තීරණය විය.

iii. 2026.02.03 දින මාසික මහසභා රැස්වීමේ යෝජනා අංක(ඊ).01.II.17 යටතේ පොදු වෙළඳපොළ තුළ පිහිටි අංක 36, 37 මාළු කඩකාමර සම්බන්ධයෙන් 2026.02.09 පිහිට වූ කමිටුවේ කමිටු වාර්තාව මහසභාවට අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
කමිටු වාර්තාවේ මන්ත්‍රීවරුන්ගේ අත්සන් නොමැති බවත්, කමිටු පත් කිරිමේ බලය හා කමිටු කැඳවීමේ බලය සභාපති හැටියට ඔබතුමන් භාරගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
ප්‍රියමාල් දසනායක මන්ත්‍රීතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙම මාළු කඩ සම්බන්ධ කමිටුව සිකුරාදා දින මුදල් කමිටුවට පෙර පැවැත්වීමට තීරණය කර තිබූ බවත්, නමුත් පද්මසිරි මන්ත්‍රීතුමන් සඳුදා දින මෙම රැස්වීම පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව කාර්යාල නිලධාරිමහත්මියකු තමාට දුරකථනයෙන් දැන් වූ බවත් ප්‍රකාශ කරන ලදී. සභාව විසින් ගත් තීරණයක් හිතුමතේ වෙනස් කළ නොහැකි බවත්, ඒ පිළිබඳ සභාපතිතමන්ට දැනුවත් කළ බවත්, පින්නවල රථගාල වටා වැටක් ස්ථාපිත කිරීම සම්බන්ධව පත්කළ කමිටුව එදික රැස්වුවාද යන්න සොයා බැලිය යුතු බවත්, ඒ සඳහා තමාගේ නමත් සාමාජික හැටියට ප්‍රකාශ වුවද තමාට කැඳවීමක් නොලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන් බල්ලාගේ වැඩේ බූරුවාට භාර නොදෙන ලෙස වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.
❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
මුදල් කමිටුව අවසානයේ ලේකම්තුමා හා සභාපතිතුමා හමු වී මේ ගැන සාකච්ඡා කළ බවත්, එහිදී බදාදා දිනය ඒ සඳහා යොදාගත් බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් කමිටු සභාපතිතුමන්ගේ සහභාගිත්වයකින් තොරව සඳුදා දින එම කමිටුව රැස් වී ඇති බවත් මෙම කමිටු වාර්තාව පිළිගත නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

සභාව සෝෂාකාරි විය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
(ඊ).01.II.17 වන යෝජනාව හා ඊට අදාළ තීරණය සභාවට ඉදිරිපත් කරන ලදී.
කාගෙන් හෝ කෙසේ හෝ වැරැද්දක් සිදුවී තිබෙන බවත්, ඉදිරියේදී එවැනි වැරදි නොවීමට කටයුතු කළ යුතු බවත්,උත්සවය සමය එළඹ ඇති බැවින් මෙහි නිවැරදි කිරීම් සිදුකළ යුතුව තිබෙන බැවින් කාර්යාලයේ තාක්ෂණ නිලධාරීන් හා සෞඛ්‍ය වෛද්‍ය මහතා සහ තමා අදාළ ස්ථානය පිළිබඳ ස්ථානීය පරීක්ෂාවක් සිදුකළ බවත්, සෞඛ්‍ය නිර්නායකයන්ට උචිත පරිදි අදාළ කඩකාමර ස්ථාපිත කිරීමට අදාළව ඇස්තමේන්තුවක් සකස් කළ බවත්, එය මෙහිදී ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී.
❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
කමිටුව රැස් වූ මොහොතේ තමා එතැන සිටි බවත් බිරිඳ සමඟ වෛද්‍යවරයකු හමුවීමට යාමට තිබූ බැවින් නුවර යාමට සිදුවූ බවත්, පිල්බෙදීමකට නොගිය බවත්, මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ගත යුතු හොඳම තීරණය

ගතයුතු බැවින් හා තමා හට පැවරු වගකීම නිසි ලෙස ඉටු කළ යුතු බැවින් නැවත එම ස්ථානය පරීක්ෂාවට ලක් කළ බවත් ප්‍රකාශ කරන ලදී.

තවද, සභාවේදී ගන්නා තීන්දු තීරණ සම්බන්ධව පොඩි සටහනක් ඒ මොහොතේදී තබා ගැනීම ඉතා වටිනා බවත්, කමිටු පත් කළ විට ඒ සම්බන්ධව කමිටු සභාපතිතුමන්හට දැනුම් දීම් කිරීමට නොහැකි වුවද, විෂය නිලධාරීතුමිය විසින් දැනුම් දීම් සිදු කරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. අතපසුවීමක් සිදු වූවා නම් කනගාටුව ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභා දේපළක් වන බැවින් ද සභාවට ආදායම් ලැබෙන ප්‍රධාන ඒකකයක් බැවින් ද සභාපතිතුමන්ගේ පැහැදිලි කිරීම අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ගේ සෘජු මැදිහත්වීමක් ඇති බැවින් ද අදාළ ඇස්තමේනතුව අනුව කටයුතු කිරීමට සභා අනුමැතිය ලබාදෙන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමන් විසින් කමිටුවක් පත්කරනු ලබන්නේ යම් යෝජනාවක් සම්බන්ධව ගතයුතු සුදුසුම තීරණය ලබාදීමට නොහැකි වන විටකදී බැවින් බවත්, එසේ කමිටු පත්කළ විට සැවොම එකට එක්ව සාමුහිකව කටයුතු කර සභා තීරණය ලබාදීමට සහය ලබාදිය යුතු බවත් ප්‍රකාශ කළ අතර සභා දේපළක් හා සභාවට ආදායම් උත්පාදනය වන ප්‍රධාන මාර්ගයක් වන බැවින්ද මෙම ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන බවත්,මෙම ඇස්තමේන්තුවට සහය ලබා දෙන්නේ කමිටු වාර්තාව පදනම් කරගෙන නොවන බව පැහැදිලිව වාර්තාවේ ඇතුළත් කළයුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යාමේදී ද විෂය නිලධාරිනිය විසින් මෙහි ගැටළුවක් පවතින බව දැන් වූ බවත්, නමුත් තීරණයක් ගතයුතු බැවින් ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඉවත ලන ජලය නිසියාකාරව බැහැර කිරීමට අදාළව ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඇස්තමේන්තුව සකස් කිරීමේදී ඒ පිළිබඳ ද සලකා බලා ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

සභාව විසින් යම් කමිටුවක් පත්කළ යුතු අවස්ථාවක් පැවතුන හොත් අනිවාර්යෙන්ම කමිටු සභාපති ඇතුළු සාමාජික මණ්ඩලය සභාපතිතුමන්ගේ අධීක්ෂණයට ලක් කළයුතු බවත්, එසේම යම් කමිටුවකට පත්කළ මන්ත්‍රීවරයකු හෝ මන්ත්‍රීවරියක් තම දායකත්වය ලබා නොදුනහොත් ඊට අදාළව පැහැදිලි තීන්දුවක් ගතයුතු බවත් හැකි සෑම විටම බෙදීමකට ගොස් හෝ සභා තීරණයක්ම ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභා තීරණයට අනුව නියම කරගත් දින එම වේලාවට කමිටුව රැස් වියයුතු බවත්, කමිටු සභාපතිතුමන්ගේ අනුමැතියක් නොමැතිව සාමාජිකයකුගේ තීරණයක් මත රැස්වන දිනය හා වේලාව වෙනස් කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

කමිටුවක් පත්කළ යුත්තේ යම් තීරණයක් ගැනීමට අපහසු මොහොතක බවත්, තීරණයක් ගැනීමට උවමනාවක් පවතී නම් පමණක් කමිටුවක් පත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පසුගිය සභා වාරවලදී කමිටු පත්කර ඇති බවත්,කමිටුව රැස්වීමක් සිදු වී නොමැති බවත්,නමුත් කමිටු වාර්තා හා කමිටු දීමනා ලබාගෙන ඇති ඉතිහාසයක් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

කමිටු රැස් නොවී කමිටු වාර්තා ලබා දී කමිටු දීමනා ලබා ගත් බව ප්‍රකාශ කළ ද එම ප්‍රකාශය වැරදි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මහජන නියෝජිතයින් වන අප සියලු දෙනාගේම වගකීම් එක සමාන බවත්, සැවොම එකට එක්ව මහජනතාවට සහයෝගය ලබා දියයුතු බවත්, කමිටු පත් කළයුතු අවස්ථාවලදී ස්වෙච්ඡාවෙන් ඒ සඳහා තම දායකත්වය ලබාදෙන ලෙසට ඉල්ලා සිටින ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
පොදු වෙළඳපොළ තුළ පිහිටි අංක 36, 37 මාළු කඩකාමර ටෙන්ඩර් කිරීමට තීරණය විය.

iv. 2025.11.25 දින පැමිණිලි පාර්ශවය විසින් (නඩු අංක - 8949 වඩුවාදෙණිය මැංදෙණිය මාර්ගය) අදාළ මාර්ගයට යටවන බිම් ප්‍රමාණයට සාධාරණ මුදලක් ලබාදීමට කටයුතු කරන්නේ නම් එම බිම් ප්‍රමාණය සභාව වෙත ලබාදීමට එකඟ විය. මේ සම්බන්ධව තීරණයක් ගැනීමට මන්ත්‍රී මණ්ඩලයෙන් කමිටුවක් පත්කර ඉදිරි කටයුතු කිරීම සඳහා සභාව අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
පැමිණිලි පාර්ශවය වන්දි මුදලක් ඉල්ලන බවත්, නමුත් වන්දි ලෙස ලබා දිය හැක්කේ තක්සේරු වටිනාකම වන බවත්, ඒ නිසා මිනුම් කටයුතු සිදුකර තක්සේරු දොපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සුදුසු බවත් මේ සඳහා කමිටුවක් පත් කිරීම අවශ්‍ය නොවන බවත් ප්‍රකාශ කරන ලදී.
❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
නඩු පැවරීමට පෙර රු.114,000.00 ගෙවන ලෙස සභාවට යෝජනා කළ බවත්, මා ඒ සම්බන්ධව එදා විරුද්ධ වූ බව ප්‍රකාශ කළ අතර අතීත තොරතුරු ඉදිරිපත් කරන ලදී.
- ✓ අඩි 06 ක ගම්සභා පාරක් පැවති බවත්,
- ✓ නඩු තීන්දුව සහා මැදිහත් වී සිදු කළයුතු බවත්,
- ✓ සමථ වියයුතු නම් මේ වන තෙක් ගෙවූ නඩු ගාස්තු සභාවට ලබාගත යුතු බවත්,
- ✓ ගම් සහා පාර සංවර්ධනය කිරීමට කැමැත්ත ප්‍රකාශ කර පුද්ගලයින්ගෙන් අත්සන් ලබා ගෙන ඇත බවත්,

යම් තීන්දු තීරණයක් ගැනීමට ප්‍රථම සභාවට ඉදිරිපත් කර මහසභා අනුමැතිය ලබා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.
❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව සම්බන්ධව ගතයුතු හොඳම තීන්දුව ලබා දීමට අවශ්‍ය බැවින් මෙම මාර්ගය සභාවට අවශ්‍ය මාර්ගයක්ද යන්න පිළිබඳ ස්ථානීය පරීක්ෂාවක් හා ලිපිගොනු පරීක්ෂා කර බලා පෙර ලබාගෙන ඇති තීන්දු තීරණ අධ්‍යනය කිරීමට කමිටුවක් ස්වෙච්ඡාවෙන් පත්වන ලෙස ඉල්ලා සිටින ලදී.
❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
අදාළ බිම් ප්‍රමාණයට අදාළව ගෙවීම් කිරීමට අවශ්‍ය මුදල තීරණය කිරීමට මන්ත්‍රීමණ්ඩලයක් අවශ්‍ය නොවන බවත්, තක්සේරු දෙපාර්තමේන්තුව මේ සම්බන්ධව දැනුවත් කිරීම ප්‍රමාණවත් බව ප්‍රකාශ කරන ලදී.
❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
ස්ථානීය පරීක්ෂාවක් සහ ලිපිගොනු පරීක්ෂාවක් නොකර සභාව විසින් තීන්දුවක් ගැනීම සුදුසු දැයි විමසන ලදී.
❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
කමිටුවක් පත් වී අදාළ තොරතුරු ඊළඟ සභා වාරයේදී තීන්දුවක් ලබා ගැනීමට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී . මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළ අතර,
කමිටු සාමාජිකයින් ලෙස,
1. කේ.සී.සරත් කුමාර මැතිතුමා
2. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
3. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
4. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය පත් කළ අතර,

ස්ථානීය පරීක්ෂාවක් සිදුකිරීමට යාම සඳහා 2026.03.09 වන දින ප.ව.03:00 ට සභා පරිශ්‍රයට පැමිණෙන ලෙසත්, ඊළඟ සභා වාරයට ප්‍රථම කමිටු වාර්තාව ලබා දෙන ලෙසටත් තීරණය විය.

v. මෙම සභාව සතු ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ලේ පිහිටි ජාතික ඉතිරි කිරීමේ බැංකුව සඳහා නව තක්සේරු වාර්තාවක් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එවා ඇත. එහෙයින් එම තක්සේරුව ක්‍රියාත්මක කිරීමට හා ක්‍රියාත්මක කරන්නේ කවදා සිටද යන්න මහසභාව තීරණය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

සභාව සතු ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ලේ පිහිටි ජාතික ඉතිරි කිරීමේ බැංකුව සඳහා රු.150,000.00 ක නව තක්සේරු වාර්තාවක් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එවා ඇති අතර එම තක්සේරුව 2026 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

vi. කිසියම් දේපළක් මත අක්කර බද්දක් පැනවීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(3) විධිවිධානයට අනුව උපරිම සීමාව හෙක්ටයාර් 01 ප්‍රමාණය ඉක්මවිය යුතුවේ. එහෙත් මෙහි පහත සඳහන් දේපළ ව්‍යවස්ථාපිත නීතියෙන් අනුමත කර ඇති උපරිම සීමාව එම දේපලට අදාළව විස්තර කර ඇති පරිදි ඉක්මවීමක් සිදුකර නොමැති බැවින් එම දේපළ අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී.

| ඉඩමේ නම | පනතේ 134(3) අදාළ නොවීමට හේතු |
|---|---|
| ටැංකිය වත්ත නොහොත් ඉඹුල්ගස්දෙණිය වත්ත (ඉඹුල්ගස්දෙණිය වසම) | කැබලි වීම (1049) අංක දරණ ඔප්පු පිටපත හා 2147 හා 4302 අංක දරණ පිඹුරු පිටපත් |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අක්කර බදු විෂය නිලධාරිනිය විසින් සිදු වූ අතපසුවීමක් බැවින් මෙම යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බවට ප්‍රකාශ කරන ලදී.

vii. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (3) විධිවිධානයට යටත් පහත සඳහන් දේපළවල හිමිකම පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බවට තහවුරු කර ඇති බැවින් එකී දේපළ වර්තමාන හිමිකාරිත්වය වෙත සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව මෙම ගරු සභා වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

| දේපළ | පැරණි හිමිකාරිත්වය | සංශෝධනය වියයුතු බවට යෝජනා කරණ වර්මාන හිමිකාරිත්වය | තහවුරු කරන ලේඛන |
|---|---|---|---|
| හුණුගල් හේන, පල්ලේ වත්ත හේන, හුණුගල්ලිද හේන, කන්දවත්ත හේන, මීගොඩ කන්ද | ඩබ්.එම්.බී.වනිගසූරිය මයා, | ඒ.ජී.නුවන් උදාර අත්තනායක මයා, | නුවන් උදාර අත්තනායක මයා වෙත විකුණූ බවට |

| | | | |
|---|---|---|---|
| වත්ත හේන ඒකාබද්ධ මහගොඩ වත්ත සහ හැලඹයගහමුල හේන කොටස (මංගලගම වසම) | | | වන 20135 අංක දරණ ඔප්පු පිටපත හා ඊට අදාළ 1348 දරණ පිඹුරු පිටපත |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

එකී දේපළ වර්තමාන හිමිකාරිත්වය වන ඒ.ජී.නුවන් උදාර අත්තනායක මයා වෙත සංශෝධනය කිරීම සඳහා තීරණය විය.

viii. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 2017 අනුව 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ජංගම නොවන වත්කම් වන ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත, ලීබඩු හා සවිකිරීම් සහ පුස්තකාල පොත්වල තක්සේරු වටිනාකම් සභා අනුමැතියට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 2017 අනුව 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ජංගම නොවන වත්කම් වන ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත, ලීබඩු හා සවිකිරීම් සහ පුස්තකාල පොත්වල තක්සේරු වටිනාකම් අනුමත කිරීමට තීරණය විය.

ix. පොදු වෙළෙඳපළ තුළ පිහිටි අංක 35 දරණ මාළු කඩකාමරය පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අංක 35 මාළු කඩ ලෙස ටෙන්ඩර් කළ නොහැකි බවත්, කුකුළු මස් කඩයක් ලෙස ටෙන්ඩර් කිරීමට සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

කුකුළු මස් කඩයක් ලෙස ටෙන්ඩර් කිරීමටත්, ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් වුවහොත් ප්‍රමාණයෙහි වෙනසක් ඇති නොකර ඔහුට අවශ්‍ය පරිදි අනෙකුත් පහසුකම් ලබා දීමටත් තීරණය විය.

x. 2026 වසරට එක වතාවක් ටෙන්ඩර් කර නොගිය දේපල හා ටෙන්ඩර් නොගිය දේපල, එළදා බදු නැවත ටෙන්ඩර් කිරීමට මහා සභාව අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**දේපළ**

1. පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 36/ 37 මාළු කඩකාමරය
2. පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 31 කුකුළු මස් කඩ කාමරය
3. පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 32 එළුමස් කඩ කාමරය
4. පොදු වෙළඳපළ තුළ පිහිටි අංක 34 කුකුළු මස් කඩ කාමරය
5. පින්නවල පොදු වැසිකිළිය

**එළදා බදු**

1. පදගම්පල උපකාර්යාලය ඉඩමේ එළදාව බදු දීම.
2. කෙසෙල්වතුගොඩ සුසාන භූමියේ එළදාව බදු දීම.
3. වැලිකන්ද සුසාන භූමියේ එළදාව බදු දීම.
4. නාගර සහා නිවාස යෝජනා ක්‍රමයේ කැබලි අංක 44 කොටසේ ක්‍රීඩා පිටියට පහළින් කොන්ක්‍රීට් කාණුවෙන් වෙන් වූ ඉඩම කොටස
5. ඉඹුල් ගස්දෙනිය ආශෝකගම මංසන්ධියේ සභාව සතු බිම් කොටස බදු දීම.
6. පදවිගම්පල යකුල්ල සුසාන භූමිය බදු දීම.
7. කෙසෙල්වතුගොඩ මල් බෙරිවත්ත 2 බිම් කොටස බදු දීම.
8. ඉඹුල්ගස්දෙණිය සනිමේඩ් සභා බිම් කොටස
9. කැගල්ල පාර නගර සහා නිවාස අංක 30/38 නිවස අසල බිම් කොටස බදු දීම.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අංක 34 හරක් මස් කඩයක් ලෙස ටෙන්ඩර් වී ඇත.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

අංක 34 ගවමස් කඩයක් ලෙසත්,අංක 35 මාළු කඩය කුකුළු මස් කඩයක් ලෙසට පරිවර්තනය කර ටෙන්ඩර් කිරීම සුදුසු බවත්,එහි දොරක් නොමැති බවත්,අනෙකුත් කඩවල ඇති ලෑලි දොරවල් කැඩී ඇති බැවින් ඒවා සකස් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

අංක 33/34 හරක් මස් කඩ ලෙසත්, අංක 30/31/32 වසා ඇති බවත්, අංක 35 කඩ කාමරයේ දොර නැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

| | |
|---|---|
| අංක - 30 - ගිව්සුම්ගත කඩයක් | අංක - 35 - කුකුළු කඩයක් |
| අංක - 31 - කුකුළු මස් කඩයක් | අංක - 36 - මාළු කඩයක් |
| අංක - 32 - එළු මස් කඩයක් | අංක - 37 - මාළු කඩයක් |
| අංක - 33 - ගව මස් කඩයක් | අංක - 38 - ගවමස් කඩයක් |

අංක - 34 - කුකුළු මස් කඩයක් ලෙස ටෙන්ඩර් කිරීම සුදුසු බවත්,මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

ඇමුණුම -03 හි ඇතුළත් දේපළ හා එළදා බදු ටෙන්ඩර් කිරීමට තීරණය විය.

- පෙ.ව.11.30 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා සභා ගර්භයෙන් ඉවත්ව යන ලදී.

xi. අංක CLG/LG – 5/3/1 – (iv වෙළුම) හා 2026.01.01 දිනැති ලිපිය පරිදි පළාත් පාලන ආයතන සතු වෙළඳ සතිපොළ, දිනපතා පොළ, කඩ කාමරය ,විවිධ කඩ කාමර බදු දීම හෝ කුලියට දීම යටතේ ලේඛනගත මුල් බදුකරුගේ පෙර ගෙවුම් මුදල ද ලේඛනයේ අවසන් බදුකරුගේ කීමනි මුදල ද මේ සමග

ඉදිරිපත් කරමි. එසේම මුල් බදුකරුගේ පෙර ගෙවූ මුදල වසර ගණනාවකට පෙර තීරණය වූ මුදලක් වන බැවින් අතුරු බදුකරුගේ අය කරගන්නා 25% ක තක්සේරු මුදල තීරණය කිරීමට මහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පෙර ගෙවූ මුදල ලෙස 25% අයකර ගැනීම සම්බන්ධව සහකාර කොමසාරිස් කාර්යාලයේ සේවයේ නියුතු බී.ආර්.එල්.වී.බණ්ඩාර මහතාගෙන් මේ සම්බන්ධව පවතින නීති හා ගතයුතු හොඳම විසඳුම පිළිබඳ උපදෙස් ලබා ගැනීම සුදුසු බැවින් එතුමා සමඟ සාකච්ඡාවක් ගෙන සභා තීරණයක් ගැනීමත්,මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

විශේෂ සභාවක් කැඳවා තීරණයක් ගැනීමට කල් තැබීමට තීරණය විය.

xii. කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවයේ යොදවා ඇති පහත නම් සඳහන් සේවකයින් තිදෙනාගේ ගිවිසුම් කාලය ඔවුන්ගේ නමට ඉදිරියෙන් ඇති දිනවල සිට ඉදිරියට මාස 03 ක කාලයකින් දීර්ඝ කර ගැනීමටත්, එම කාලය සඳහා ඔවුන් වෙත දෛනිකව රු.1,500.00 ක දීමනාවක් ගෙවීම් කිරීමටත් සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

| | |
|---|---|
| එච්.එන්.පී.හෙට්ටිආරච්චි මයා | - 2026.04.02 සිට 2026.07.01 දක්වා |
| ඒ.ඩී. ගුණරත්න මයා | - 2026.05.01 සිට 2026.07.31 දක්වා |
| ආර්.ඩී.එස්.ප්‍රදීප් කුමාර මයා | - 2026.05.01 සිට 2026.07.31 දක්වා |

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

මෙහි වැටුප වැඩ කිරීමේ හැකියාවක් නැතිද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වැටුප් වැඩි කිරීමකට යාමට නම් ඔවුන්ගේ ඉල්ලීමක් අවශ්‍ය බවත්, ඒ අනුව ආණ්ඩුකාර අනුමැතිය ලබා ගත යුතු බවත්, අවුරුද්දක සේවා කාලයකට ගිවිසුම්ගතව බඳවා ගෙන ඇති බවත්, මාස 03 න් 03 ට ගිවිසුම් කාලය අලුත් කළ යුතු බවත් ප්‍රකාශ කළ අතර මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව සභා සම්මත විය.

තීරණය -

කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවයේ යොදවා ඇති පහත නම් සඳහන් සේවකයින් තිදෙනාගේ ගිවිසුම් කාලය ඔවුන්ගේ නමට ඉදිරියෙන් ඇති දිනවල සිට ඉදිරියට මාස 03 ක කාලයකින් දීර්ඝ කර ගැනීමටත්, එම කාලය සඳහා ඔවුන් වෙත දෛනිකව රු.1,500.00 ක දීමනාවක් ගෙවීම් කිරීමටත් තීරණය විය.

| | |
|---|---|
| එච්.එන්.පී.හෙට්ටිආරච්චි මයා | - 2026.04.02 සිට 2026.07.01 දක්වා |
| ඒ.ඩී. ගුණරත්න මයා | - 2026.05.01 සිට 2026.07.31 දක්වා |
| ආර්.ඩී.එස්.ප්‍රදීප් කුමාර මයා | - 2026.05.01 සිට 2026.07.31 දක්වා |

xiii. **ණය ශේෂ කපා හැරීම සම්බන්ධවයි.** ණයකරු - ජේ.ඒ.වසන්ති කුමාරි මිය (සංවර්ධන නිලධාරී)

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/AD/1/9/6 දරණ 2026.02.09 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි එවකට සභාපතිධුරය දැරූ ජී.ජී ජයසිංහ මහතා මියගොස් ඇති බැවින් ඔහුගෙන් අයකර ගතයුතුව ඇති 50% ක මුදල එනම් රු.29,350.00 ක ණය මුදල කපා හැරීමට සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට

ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**ණය මුදල**

- ✓ ණයකරු - ජේ.ඒ.වසන්ති කුමාරි මිය (සංවර්ධන නිලධාරී) ආපදා - රු.58,300.00 උත්සව අත්තිකාරම් - රු.400.00 පොලිස් වාර්තා අනුව මිය ගොස් ඇත.
- ✓ මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාව අනුව වගකිය යුත්තන්,
  1.ජී.ජී.ජයසිංහ මහතා - හිටපු සභාපති - උක්ත ණය මුදලින් 50% ක් අය කළ යුතුය.
  2.එන්.ඒ.ප්‍රේමදාස මහතා - හිටපු ලේකම් - ණය මුදලින් 50% අයකර ගැනීම සඳහා නඩු ගොනු කිරීමට කටයුතු කර ඇත.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මාවනැල්ල ලේකම් ලෙස සඳහන් වී ඇති බවත්, එය නිවැරදි විය යුතු බවත්, ණයකරු හා හිටපු සභාපති මියගොස් ඇති බවත්, ලේකම්තුමාත් රෝගාතුරුව සිටින බැවින් ඔහුගේ මුදල කපා හැරීම ද සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද ලිපිය සභාවට නැවත ඉදිරිපත් කරන ලදී. අංක 05ට අදාළව තීන්දුව දෙන ලදී.මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/AD/1/9/6 දරණ 2026.02.09 ලිපයෙහි සඳහන් පරිදි එවකට සභාපතිධුරය දැරූ ජී.ජී ජයසිංහ මහතා මිය ගොස් ඇත් බැවින් එතුමාගෙන් අය කර ගතයුතු 50% ක් වන රු29,350.00 ක ණය මුදල කපාහැරීමට හා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීමටත්, එවකට ලේකම්ධුරය දැරූ එන්.ඒ.ප්‍රේමදාස මහතා (අභියාචනාකරු) මහතාගෙන් 50% ක් වන රු29,350.00 ක මුදල අයකර ගැනීමට හා එතුමා ඒ සම්බන්ධව දැනුවත් කිරීමටත් තීරණය විය.

xiv. 2026 පොදු අරමුදල් යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ තීන්ත ආලේප කිරීම සඳහා වන රු.350,000.00 ක් වන ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීම සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව සභා සම්මත විය.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ තීන්ත ආලේප කිරීම සඳහා වන රු.350,000.00 ක් වන ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

xv. 2026 පොදු අරමුදල් යටතේ ඉඹුල්ගස්දෙණිය පුස්තකාලය වටා ඇති වැට සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,150,000.00 වටිනා ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

මායිම් වෙනස් වී ඇති බැවින් මිනුම් කටයුත්තකට යටත්ව සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ ඉඹුල්ගස්දෙණිය පුස්තකාලය වටා ඇති වැට සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන රු.1,150,000.00ක් වටිනා ඇස්තමේන්තුව අනුමත තීරණමට තීරණය විය.

xvi. හිරිවඩුන්න මාදන මාර්ගයේ ආරම්භක ස්ථානයේ මාර්ග තලය පළුදු වී ඇති ස්ථාන පිළිසකර කිරීම සඳහා වන රු.32,000.00 ක් වන ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

හිරිවඩුන්න මාදන මාර්ගයේ ආරම්භක ස්ථානයේ මාර්ග තලය පළුදු වී ඇති ස්ථාන පිළිසකර කිරීම සඳහා වන රු.32,000.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත තීරණමට තීරණය විය.

xvii. 2026.01.21 දින සිට 2026.02.20 දක්වා ගෙවීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2026.01.21 | 80 | මින්වාන ගොවි සංවිධානය | බොලගම කනත්තපාර සංවර්ධනය කිරීම | 292,900.81 |
| 2026.01.22 | 81 | මුදල් භාරකරු | 2026 ජනවාරි මස වැටුප් ගෙවීම සඳහා ගෙවීම | 7,954,325.69 |
| 2026.01.26 | 82 | ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය | කුරුදුවත්ත කෝන්ගස්හන්දිය අසල මාර්ගය සංවර්ධනය කිරීම | 48,475.00 |
| | 83 | ප්‍රගති ගොවි සංවිධානය | අන්දිරමඩ පින්කුඹුර පැති බැම්ම සකස් කිරීම -10% රැඳවුම් මුදල් ගෙවීම | 52,975.00 |
| | 84 | ජනසවි ගොවි සංවිධානය | හේවාදිවෙල කටුපදුර මාර්ගය සංවර්ධනය සඳහා ගෙවීම | 37,393.04 |
| | 85 | ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී | කාර්යාල දුරකථන බිල්පත් ගෙවීම | 3,095.99 |
| | 86 | ප්‍රධාන තක්සේරුකරු | 2026 වර්ෂය වරිපනම් බදු ප්‍රතිශෝධනය කිරීම සඳහා ගෙවීම | 600,000.00 |
| | 87 | ලේඛා ස්ටේෂනරිස් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය - දෙසැම්බර් මස පුවත්පත් බිල්පත් ගෙවීම | 15,690.00 |
| | 88 | ලේඛා ස්ටේෂනරිස් | රඹුක්කන පුස්තකාලය - පුවත්පත් බිල්පත් ගෙවීම | 18,190.00 |
| | 89 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | yu-6935 ත්‍රිරෝද රථය රක්ෂණාවරනය සිදු කිරීම | 16,342.93 |
| | 90 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් ප්‍රයිවට් ලිමිටඩ් | බැකෝ ලෝඩරය අලුත් වැඩියා කිරීම සඳහා ගෙවීම | 26,194.60 |

| | | | | |
|---|---|---|---|---|
| | 91 | තුසිත එන්ටප්‍රයිසස් | LL-6393 ෆොටෝන් ට්‍රක් රථය අලුත් වැඩියා කිරීම | 401,225.00 |
| | 92 | එම්.ජී.එස්.ටී. මුදලිගේ | ආහාර සාම්පල් පරීක්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම | 3,670.00 |
| | 93 | බී.ඩබ්. එම්.පී.ජේ.එම්.බරණගල | ආහාර සාම්පල් පරීක්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම | 2,428.00 |
| | 94 | පී.ජී.සී. කරුණාරත්න | ආහාර සාම්පල් පරීක්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම | 4,851.00 |
| | 95 | ටී.එම්. ලාහිරි | ගලි බවුසරය වෙන් කිරීම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 9,755.00 |
| | 96 | කේ.එම්.ඒ.කේ. අබේරත්න | 2025 වර්ෂයට අදාළ සතිපොළ ගිවිසුම් ඇප මුදල් ආපසු ගෙවීම | 351,630.00 |
| | 97 | මුදල් භාරකරු | විශේෂ අත්තිකාරම් ගෙවීම | 24,000.00 |
| | 98 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් ගෙවීම | 160,000.00 |
| 2026.01.28 | 99 | එම්.සී. කමලාවති | වෛද්‍යාධාර ලබා දීම | 10,000.00 |
| | 100 | බි.සෝමාවති | වෛද්‍යාධාර ලබා දීම | 10,000.00 |
| 2026.01.29 | 101 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරීම | 60,000.00 |
| | 102 | නාමල් සර්විස් සෙන්ටර් | RD-4337 ට්‍රැක්ටරය පූර්ණ වාර සේවාව සිදු කිරීම | 33,395.00 |
| | 103 | පී.ජී.එල්.සී. කුමාර | 251-2198 කැබ් රථය ටයර් මාරු කිරීම සඳහා ගෙවීම | 1,000.00 |
| | 104 | පී.ජී.එල්.සී. කුමාර | RD-5925 ට්‍රැක්ටරය අලුත් වැඩියා කිරීම සඳහා ගෙවීම | 250.00 |
| | 105 | ජාතික ජල සම්පාදන මණ්ඩලය - කෑගල්ල | 2025 දෙසැම්බර්, ජනවාරි මාස වලය අදාළ ජල බිල්පත් ගෙවීම | 10,140.14 |
| | 106 | ජාතික ජල සම්පාදන මණ්ඩලය - කුරුණෑගල | ඉඹුල්ගස්දෙනිය පුස්තකාල ජල බිල්පත් ගෙවීම | 1,648.07 |
| | 107 | එච්.පී. නලින් නන්දසේන | තණකොළ කපන යන්ත්‍ර අලුත් වැඩියා කිරීම සඳහා ගෙවීම | 2,450.00 |
| | 108 | මෙට්‍රෝපොලිටන් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | 04489 CANON ප්‍රින්ටරය අලුත් වැඩියාව | 15,458.00 |
| | 109 | අආර්.පී. මල්කාන්ති | ජලනල ආප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 110 | ඒ.ආර්.ඩී. බණ්ඩාර | ජලනල ආප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 111 | එච්.පී.එන්. රණසිංහ | ජලනල ආප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 112 | බී.ටී.ඩී. බටුවන | ජලනල ආප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 113 | ඩී.එම්.ඩබ්. ඩී.බී. දිද්‍යානායක | ක්‍රීඩාංගන ආප තැන්පතු ආපසු ගෙවීම | 5,689.46 |
| | 114 | එම්.පී. ලංකා කාන්ති | පින්නවල අලි අනාථාගාරය අසල රථගාල 2025 වර්ෂයට අදාළ ගිවිසුම් ඇප මුදල් ආපසු ගෙවීම | 691,245.00 |
| | 115 | එම්.පී. ලංකාකාන්ති | පින්නවල අලි අනාථාගාරය අසල රථගාල සංවර්ධනය සඳහා වසා දමන ලද කාලය සඳහා බදුකරු විසින් වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 104,057.80 |
| | 116 | සිතාරා ප්‍රින්ටර්ස් | මුද්‍රණ කටයුතු සිදු කිරීම සඳහා ගෙවීම | 5,568.00 |
| | 117 | සිතාරා ප්‍රින්ටර්ස් | මුද්‍රණ කටයුතු සිදු කිරීම සඳහා ගෙවීම | 20,280.00 |
| | 118 | ශීලා ප්‍රින්ටර්ස් | අයදුම්පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම | 8,300.00 |
| | 119 | මහනුවර ට්‍රේඩර්ස් | ග්ලවුස් සැපයීම වෙනුවෙන් ගෙවීම | 7,000.00 |
| | 120 | kegalle distributors Pvt Ltd | ආදාහනාගාරය සඳහා ලිට්රෝ ගෑස් සිලින්ඩර 09 ක් සැපයීම වෙනුවෙන් ගෙවීම | 149,105.00 |
| | 121 | භාෂිත ග්‍රැෆික් | මුද්‍රණ කටයුතු සිදු කිරීම සඳහා ගෙවීම | 1,932.00 |
| 2025.02.03 | 122 | මුදල් භාරකරු | 2026 ජනවාරි මස සහික දීමනා ගෙවීම | 510,000.00 |
| | 123 | මුදල් භාරකරු | YU -6935 ත්‍රිරෝද රථයයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා ගත් අත්තිකාරම පියවීම | 1,710.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 124 | ජේ.එම්.ඩී.වීරතුංග | ගමන් වියදම් ගෙවීම | 504.00 |
| | 125 | කේ.ජී. ධනුක ශ්‍රීමාල් | අතිකාල දීමනා ගෙවීම | 7,865.27 |
| | 126 | ඩී.ජී.සී.ජී.එස්. කුමාරි | ගමන් වියදම් ගෙවීම | 504.00 |
| | 127 | ප්‍රධාන තක්සේරුකරු | පින්නවල වාහන නැවතුම්පල තක්සේරු කිරීමේ අත්තිකාරම් තක්සේරු මුදල ගෙවීම | 2,500.00 |
| | 128 | Timeco Solutions (pvt)Ltg | ඇඟිලි සලකුණු යන්ත්‍රය නඩත්තු  කිරීමේ සේවා ගාස්තු ගෙවීම | 22,500.00 |
| | 129 | එන්.සන්ධ්‍යා හේම කුමාරි | රඹුක්කන කෙසෙල්කන් වෙළඳපල ටෙන්ඩර් ඇප තැන්පතු ආපසු ගෙවීම | 8,500.00 |
| | 130 | එන් සන්ධ්‍යා හේම කුමාරි | 2025 වර්ෂයට කෙසෙල්කන් වෙළඳපල මාස 03ක ගිවිසුම් ඇප මුදල ආපසු ගෙවීම | 34,980.00 |
| | 131 | මුදල් භාරකරු | 2026 ජනවාරි මන්ත්‍රී සභික දීමනා ගෙවීම | 40,000.00 |
| 2026.02.05 | 132 | මුදල් භාරකරු | 251-2198 ඉසුසු කැබ් රථය ආදායම් බලපත්‍රය ලබා ගැනිම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනිම | 14,340.00 |
| | 133 | මුදල් භාරකරු | නිල ඇඳුම් දීමනා ගෙවීම | 44,000.00 |
| | 134 | සි/ස විවිධ සේවා සමුපකාර සමිතිය | අලගල්ල ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරිම | 1,630,172.23 |
| 2026.02.06 | 135 | මුදල් භාරකරු | උත්සව අත්කිකාරම් ,විශේෂ අත්කිකාරම් ගෙවීම | 34,000.00 |
| | 136 | මුදල් භාරකරු | PF-7429  කැබ් රථය අලුත් වැඩියා කිරිම වෙනුවෙන් ඩබ්.ඒ.ආර්.එස්. විජේසූරිය යන අය අතින් වියදම් කළ මුදල් ගෙවීම | 1,000.00 |
| | 137 | මුදල් භාරකරු | RE-2261 ට්‍රැක්ටරය අලුත් වැඩියා කිරිම වෙනුවෙන් ඩබ්.ඒ.ආර්.එස්. විජේසූරිය යන අය අතින් වියදම් කළ මුදල් ගෙවීම | 800.00 |
| | 138 | සි/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඊදැල්ල වත්ත  හරංකහතැන්න මාර්ගය සංවර්ධනය කිරිම - 11 අදියර | 802,426.07 |
| | 139 | සි/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඊදැල්ල වත්ත  හරංකහතැන්න මාර්ගය සංවර්ධනය කිරිම - 1 අදියර | 730,859.55 |
| | 140 | එකමුතු ගොවි සංවිධානය | රඹුක්කන පශු වෛද්‍ය කාර්යාලය අලුත් වැඩියා කිරීම සඳහා ගෙවීම | 1,005,487.44 |
| | 141 | පී.ජී.එල් සී. කුමාර | RD - 8009 ට්‍රැක්ටරය ඉදිරිපස දකුණු රෝදය සඳහා පැච් දැමීම | 600.00 |
| | 142 | පී.ජී.එල් සී. කුමාර | RD - 8009 ට්‍රැක්ටරය ඉදිරිපස වම් රෝදය සඳහා පැච් දැමීම | 600.00 |
| | 143 | පී.ජී.එල් සී. කුමාර | ZA-0191 බැකෝ ලෝඩරය  අලුත් වැඩියා කිරීම | 3,500.00 |
| | 144 | පී.ජී.එල් සී. කුමාර | LL-6393 ට්‍රක් රථය ටයර් මාරු කිරීම සඳහා ගෙවීම | 2,400.00 |
| | 145 | වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් වීල් එලයිමන්ට් | ZA-0191 බැකෝ ලෝඩරය සඳහා නව ටියුබයක් මාරු කිරීම | 500.00 |
| | 147 | ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවීම | 48,251.08 |
| | 146 | ප්‍රධාන තක්සේරුකරු | ජාතික ඉතිරි කිරීමේ බැංකු පරිශ්‍රය තක්සේරු කිරීමේ බතිරි ගාස්තු ගෙවීම | 26,520.00 |
| | 148 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 2025 දෙසැම්බර්, 2026 ජනවාරි මාස වල ජල බිල්පත් ගෙවීම | 108,706.12 |
| | 149 | ශ්‍රී ලංකා ටෙලිකොම් | දුරකථන බිල්පත් ගෙවීම | 14,776.91 |
| | 150 | ආර්.ඒ.පී.එස්.රණසිංහ | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 726.63 |
| | 151 | එච්.ඩබ්.ආර්.එස්.විද්‍යාධර | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 951.05 |
| | 152 | ආර්.ජී.එස්.නිරෝෂන් | නිවාඩු දින සේවය කිරිම වෙනුවෙන් වැටුප් ගෙවීම | 13,712.00 |
| | 153 | එස්.ඩබ්.සී.එස්.නන්දන | අතිකාල දීමනා ගෙවීම | 7,345.42 |
| | 154 | ජී.ජී.බී.ඒ.කුමාර් | අතිකාල දීමනා ගෙවීම | 8,165.85 |
| | 155 | බී.ඒ.බන්දුසේන | අතිකාල දීමනා ගෙවීම | 8,314.81 |

| | | | | |
|---|---|---|---|---|
| | 156 | පි.ගීත් ප්‍රේම ශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 4,285.19 |
| | 157 | එස්.ඩබ්.පී. ධර්මසේන | අතිකාල දීමනා ගෙවීම | 7,231.62 |
| | 158 | එච්.ඩබ්.ඒ.අයි.එල්. වීරකෝන් | අතිකාල දීමනා ගෙවීම | 7,574.07 |
| | 159 | එස්.එන් නන්ද ශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 7,574.07 |
| | 160 | ඩී.ඩබ්.ජී.ඒ.සඳරුවන් | අතිකාල දීමනා ගෙවීම | 2,259.26 |
| | 161 | එස්.ඩබ්.ශ්‍රීලාල් ශ්‍රීයානන්ද | අතිකාල දීමනා ගෙවීම | 4,666.67 |
| | 162 | එම්.එන්. පද්මසිරි | අතිකාල දීමනා ගෙවීම | 7,490.74 |
| | 163 | එන්.ජී. අජිත් ප්‍රියන්ත කුමාර | අතිකාල දීමනා ගෙවීම | 6,891.48 |
| | 164 | ආර්.ආර්.සාලින්ද කුමාර | අතිකාල දීමනා ගෙවීම | 11,537.03 |
| | 165 | ජී.ආර්.වයි.සමන් කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 2,996.29 |
| | 166 | ඩබ්.නලින් පුෂ්ප කුමාර | අතිකාල දීමනා ගෙවීම | 2,108.44 |
| | 167 | ඩබ්.ජී.එල්. සුබසිංහ | අතිකාල දීමනා ගෙවීම | 1,947.59 |
| | 168 | එස්.ජේ.එස්.සමරසිංහ | අතිකාල දීමනා ගෙවීම | 21,543.33 |
| | 169 | ඩබ්.ඒ.ආර්.එස්.විජේසූරිය | අතිකාල දීමනා ගෙවීම | 6,949.31 |
| | 170 | එච්.සී.කේ.හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවීම | 17,079.42 |
| | 171 | එච්.ඒ.ජී.එල්.පියසේන | අතිකාල දීමනා ගෙවීම | 17,106.00 |
| | 172 | ඩබ්.ඩබ්.ඩී.වීරක්කොඩි | අතිකාල දීමනා ගෙවීම | 16,854.00 |
| | 173 | එස්.ජේ.එස්.සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 4,400.00 |
| | 174 | එච්.ආර්.එම්.කේ.හෙට්ටිආරච්චි | ගමන් වියදම් ගෙවීම | 4,340.00 |
| | 175 | එච්.ආර්.වරුණි ප්‍රියංගා | ගමන් වියදම් ගෙවීම | 8,500.00 |
| | 176 | මුදල් භාරකරු | 2026 ජනවාරි මස අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියට අදාළ වැටුප් ගෙවීම | 136,275.00 |
| 2026.02.12 | 177 | මුදල් භාරකරු | ගලිරථ දිරි දීමනා ගෙවීම | 21,000.00 |
| | 178 | මුදල් භාරකරු | 52-6699 කැබ් රථය අලුත් වැඩියා කිරීම සඳහා ඩබ්.ඒ.පී.එස්. විජේසූරිය යන අය අතින් වියදම් කළ මුදල් ගෙවීම | 1,900.00 |
| | 179 | මුදල් භාරකරු | හලර් යන්ත්‍රය සපයා ගැනීම තාක්ෂණික ඇගයුම් කමිටු සාමාජිකයන් හට ගෙවීම | 11,000.00 |
| | 180 | මුදල් භාරකරු | බේල් යන්ත්‍රය සපයා ගැනීම තාක්ෂණික ඇගයුම් කමිටු සාමාජිකයන් හට ගෙවීම | 6,500.00 |
| | 181 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 ඔක්තෝම්බර් මාසයට අදාළ ආයතන නිළධාරින් ලබා ගත් දුම්රිය බලපත්‍ර සඳහා ගෙවීම | 20,200.00 |
| | 182 | ලංකා විදුලි බල මණ්ඩලය | පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලට අයත්ව තිබූ විදුලි බිල්පතෙහි හිඟ මුදල ගෙවීම | 1,433.84 |
| | 183 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025 දෙසැම්බර්, 2026 ජනවාරි මාස වල අදාළ විදුලි බිල්පත් ගෙවීම | 1,666.67 |
| | 184 | ප්‍රධාන තක්සේරුකරු | සී/ස කිණිගොඩ කොරලේ ඉඩම් උකස් බැංකු පරිශ්‍රය තක්සේරු කිරීමේ ඉතිරි ගාස්තු ගෙවීම | 26,520.00 |
| | 185 | ප්‍රධාන තක්සේරුකරු | පෞද්ගලික බස් නැවතුම්පල සඳහා බිම්බදු තක්සේරුවක් ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ගෙවීම | 100,000.00 |
| | 186 | ජේ.ආර්. මහින්ද බංඩාර ජයකොඩි | අධිකරණ නියෝගයට අනුව 8977 පැරණි පිඹුර අධීස්ථාපනය කිරීමට මුදල් ගෙවීම | 20,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 187 | එල් ආර්.එම්.පුංචිබණ්ඩා | ගලි බවුසරය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇපකැන්පතු ආපසු ගෙවීම | 9,332.50 |
| | 188 | පිච්චෙයි වේලු | ගලි බවුසරය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 7,805.00 |
| | 189 | එම්.පී.සුසන්ත කුමාර | 52-6699 කැබ් රථය අලුත් වැඩියා කිරීම සඳහා ගෙවීම | 2,500.00 |
| 2026.02.16 | 190 | වි.ආර්.එන් ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 7,790.32 |
| | 191 | එම්.ඒ.එල් මාලනි | අතිකාල දීමනා ගෙවීම | 2,779.66 |
| | 192 | එම්.ඒ.එල් මාලනි | ගමන් වියදම් ගෙවීම | 1,359.00 |
| | 193 | ආර්.එම්.එස්.ඒ. රත්නායක | ගමන් වියදම් ගෙවීම | 6,150.06 |
| | 194 | එල් .ආර්.ඒ.ඩී. කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 4,753.00 |
| | 195 | කිළිණී නිරෝෂණී | ගමන් වියදම් ගෙවීම | 4,850.00 |
| | 196 | ඩබ්.ඩබ්.ඩී. වීරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 700.00 |
| | 197 | ඩබ්.ඩබ්.ඩී. වීරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 1,029.00 |
| | 198 | ඩබ්.ඩබ්.ඩී. වීරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 1,050.00 |
| | 199 | එච්.ආර්.යූ.කේ.සේනානායක | ගමන් වියදම් ගෙවීම | 350.00 |
| | 200 | බී.ඒ.අංසක හංස කුමාර | ගමන් වියදම් ගෙවීම | 1,750.00 |
| | 201 | එම්.ඒ.එල් මාලනි | ගමන් වියදම් ගෙවීම | 665.00 |
| | 202 | අධ්‍යක්ෂ ජාතික එලදායිතා ලේකම් කාර්යාලය | 2025/2026 ජාතික ඵලදායිකා තරඟාවලිය සඳහා ලියාපදිංචි ගාස්තු ගෙවීම | 2,500.00 |
| 2026.02.17 | 203 | කේ.එම්.ඒ.කේ අබේරත්න | 2025 වර්ෂයට සතිපොළ ප්‍රසම්පාදන ඇප මුදල් ආපසු ගෙවීම | 15,000.00 |
| | 204 | ඩබ්. ඒ.ආර්.එස්. විජේසූරිය | LL- 7614කැබ් රථය සඳහා අලුත් වැඩියා කිරීම සඳහා අතින් වියදම් කල මුදල් ගෙවීම | 2,650.00 |
| | 205 | එම්.ආර්.එම්.රුෂාන් | 2026 වර්ෂයට පොදු වෙළඳපල අංක 38 ගව මස් කඩ කාමරය ලංසු ඇප මුදල් ආපසු ගෙවීම | 8,500.00 |
| | 206 | නත්තඹුර වසමේ වැඩිහිටියන්ගේ සමිතිය | කාඩවට්ටිය වල්පොල මාර්ගය සංවර්ධන කිරීම සඳහා ගෙවීම | 343,994.02 |
| | 207 | රංජනී බේක් හවුස් | මහ සභාව සඳහා සංග්‍රහ වියදම් ගෙවීම | 5,494.00 |
| | 208 | වන්වේ ටයර් සෙන්ටර් | බැකෝ යන්ත්‍රය අලුත් වැඩියා කිරීම සඳහා ගෙවීම | 800.00 |
| | 209 | මුදල් භාරකරු | හල්පිටිය එරමිණිගොල්ල පොදු සුසාන භූමිය ලංසු ඇප මුදල 2026 වර්ෂයේ බදු කුලියට හිලව් කිරීම | 100.00 |
| | 210 | මුදල් භාරකරු | ලබු කොටුව නිවාස එලදාව 2026 වර්ෂයේ බදු කුලියට හිලව් කිරීම | 2,000.00 |
| | 211 | එස්.එම්.කේ.බී සමරකෝන් | ජලනල උපකරණ ලබා ගැනිම සඳහා ගෙවීම | 435.00 |
| | 212 | කේ.එම්.සී.ඊ. විජේරත්න | ලේඛනාගාරය සඳහා යකඩ රාක්ක සකස් කිරීම සඳහා ගෙවීම | 137,975.00 |
| | 213 | සම්පත් ප්‍රින්ටින් | අයදුම්පත් මුද්‍රණය කිරීම | 4,802.70 |
| | 214 | සුරමායා සෙරමික් | ජලනල උපකරණ ලබා ගැනිම | 6,445.00 |
| | 215 | සම්පත් එන්ටප්‍රයිසස් | සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම | 44,032.80 |
| | 216 | kegall Distrinutors (pvt)ltd | ආදාහනාගාරය සඳහා ගෑස් සැපයිම | 49,685.00 |
| | 217 | භාෂිත ග්‍රැෆික් | මහ සභාව සඳහා අවශ්‍ය ඇමුණුම් මුද්‍රණය කිරීම | 4,884.00 |
| | 218 | භාෂිත ග්‍රැෆික් | බයිසිකල් තහඩු සඳහා වන ස්ටිකර් මුද්‍රණය කිරීම | 244.00 |
| | 219 | භාෂිත ග්‍රැෆික් | මහ සභා වාර්තා මුද්‍රණය කිරීම | 6,910.50 |

| | | | | |
|---|---|---|---|---|
| | 220 | the associated news paper of Ceylon Limited | සභාව සතු දේපල අයිතිය 2026 වර්ෂයට ටෙන්ඩර් කිරීමේ ප්‍රසම්පාදන දැන්වීම් පල කිරීම සඳහා ගෙවීම | 57,348.00 |
| | 221 | the associated news paper of Ceylon Limited | රඹුක්කන පොදු වැසිකිළිය ඉදිරිපිට ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන කාර්යය වෙනුවෙන් පුවත්පත් දැන්වීම් පල කිරීම | 132,160.00 |
| | 222 | මුදල් භාරකරු | 251-2198 කැබ් රථයේ ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා ගත් අත්තිකාරම පියවීම | 14,340.00 |
| 2026.02.18 | 223 | කොත්තනවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය | නවගමුව හාල්පාන් කුඹුර පාර සංවර්ධනය කිරිම අවසන් බිල්පත ගෙවීම | 409,076.83 |
| | 224 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඉන්ධන බිල්පත් ගෙවීම | 786,398.00 |
| | 225 | එම්.පී.සුසන්ත කුමාර | LL-7914 කැබ් රථය අලුත් වැඩියා කිරීම සඳහා ගෙවීම | 1,500.00 |
| | 226 | ශ්‍රී ලංකා ටෙලිකොම් | කාර්යාල දුරකථන බිල්පත් ගෙවීම | 12,902.47 |
| | 227 | මුදල් භාරකරු | සැලසුම් කමිටු දීමනා ගෙවීම | 15,500.00 |
| | 228 | බී.ඒ.රෝෂාන් ප්‍රසාද් | ගලිබවුසරය සඳහා ගෙවා ඇති වැඩිපුර මුදල ගෙවීම | 2,000.00 |
| 2026.02.20 | 229 | සිහින ආකිටෙක් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් | කොම්පෝස්ට් අංගනය ආරක්ෂිත වැට සහ රඹුක්කන ටී.සී. නිවාස වොලිබෝල් පිට්ටනිය සංවර්ධනය ව්‍යාපෘතියේ ටෙන්ඩර් ඇප ආපසු ගෙවීම | 55,000.00 |
| | 230 | පදවිගම්පල ශ්‍රී මලියදේව වැඩිහිටි සමිතිය | ආදොළුව මාර්ගයේ නව බෝක්කු බට යෙදීම සඳහා ගෙවීම | 352,865.74 |
| | 231 | අමාෂා ඉන්ජිනියරින්ස් | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම ව්‍යාපෘතියේ තැන්පත් මුදල් ආපසු ගෙවීම | 147,087.50 |
| | 232 | ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවීම | 10,025.65 |
| | 233 | ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවීම | 63,704.34 |
| | 234 | C-com equipemt (pvt)Ltd | බොබ් කැට් යන්ත්‍රය අලුත් වැඩියා කිරීම සඳහා ගෙවීම | 39,888.50 |
| | 235 | එච්.ආර්.එම්.ඩබ්. බංඩාර | ක්‍රීඩාංගන වෙන් කිරීම සඳහා ගෙවන ලද ගාස්තු සහ ඇප තැන්පතු ආපසු ගෙවීම | 135,000.00 |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2026.01.21 දින සිට 2026.02.20 දක්වා ගෙවීම් වාර්තාව අනුමත තීරණමට තීරණය විය.

**(ඊ).02.ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**

i. ගහේකුඹුර, උඩහගෙදර වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**
ගහේකුඹුර, උඩහගෙදර වත්ත මාර්ගයේ පළුදු වී ඇති ස්ථාන කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ගණේකුඹුර, උඩහගෙදර වත්ත මාර්ගයේ පළුදු වී ඇති ස්ථාන කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට තීරණය විය.

ii. තරුණ කටයුතු සංවර්ධනය කිරීම වෙනුවෙන් රැකියා සහ ව්‍යවසායකත්ව පොළක් සංවිධානය කිරීම සුදුසු බවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**
තරුණ කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ව්‍යවසායකයින් හා ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන් සහ ස්වයං රැකියාවල නියැලී සිටින තරුණ තරුණියන් ඒකරාශී කර රැකියා පොළක් පැවැත්වීම මින් අදහස් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මෙවැනි රැකියා වෙළඳපොළවල් පවත්වා තිබෙන බවත්, මෙම යෝජනාව ඔවුන් හා එක්ව කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**
ජූනි මාසය වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බවත්, ඔවුන් හා ඒකාබද්ධව කටයුතු කිරීමට සභා අනුමැතිය අවශ්‍ය බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
තරුණ තරුණියන් පිළිබඳ අවධානය යොමු කිරීම සම්බන්ධව අගය කරන බවත්, බලයට පැමිණ අවුරුද්දකට ආසන්න වුවත් අඩු ආදායම් ලාභීන් දිරිගැන්වීමේ ව්‍යාපෘති මෙතෙක් සිදුකර නොමැති බවත්, ස්වයං රැකියා නගා සිටුවීමට අවශ්‍ය මූල්‍යමය ආධාර ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකි නම් ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**
දිස්ත්‍රික්කය පුරා අඩු ආදායම්ලාභී පවුල් 1300කට අධික ප්‍රමාණයකට රු.150,000.00ට යටත්ව අවශ්‍යතාවය මත ආසියානු සංවර්ධන බැංකුව යටතේ ලබා දුන් මූල්‍යමය ආධාර ලබා දී ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සාකච්ඡා කර ඔවුන් හා ඒකාබද්ධව මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බවට සංශෝධන සහිතව ඉදිරිපත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**
මුලින්ම යෝජනාව අනුමත කර ගැනීමට අවශ්‍ය බවත් පසුව ව්‍යාපෘති වාර්තාව හා ඇස්තමේන්තුව සකස් කර ඉදිරි සභා වාරයකදී ඒ සඳහා අනුමිතිය ලබා ගැනීමට තමා අපේක්ෂා කල බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මූලික අනුමැතිය ලබාදීම සුදුසු බවත්, මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මූලික අනුමැතිය ලබාදීම තීරණය විය.

iii. මැදගම කන්ද පාරේ සෝදායාමට ලක්ව ඇති ස්ථානය සඳහා පැතිබැම්මක් ඉදිකිරීම සුදුසු බවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා**

වර්ෂා කාලයේදී සෝදා යාමට ලක්වන ඉවුරු කාදනයක් සිදුවී ඇති මෙම ස්ථානයට පැතිබැම්මක් ඉදිකර මාර්ගය ආරක්ෂා කර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

රඹුක්කන කොට්ඨාසයේ මාර්ග රසකම මෙවැනි අවධානම් ස්ථාන පවතින බවත්, ගියවර මෙවැනි සංවර්ධන ව්‍යාපෘති සභාවට ඉදිරිපත් නොකර ප්‍රජා මූල සංවිධාන වෙත යොමු කරන ලෙසත්, සභාපති ලෙස ඔබතුමන් දන්නා සිටි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

**මෙම අවස්ථාව පෞද්ගලික පැහැදිලි කිරීම් අවස්ථාවක් ද යන්න විමසන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

තම අදහස් ප්‍රකාශ කර අවසන් වන තෙක්ම අසා සිටින විට ඒ පිළිබඳව එතුමන්ට අදහස් ගත හැකි බවත් සෑම විටකම බාධා කිරීම නොකරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. තවද පවතින ප්‍රතිපාදන වලින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව සැවොම දැනුවත් කිරීම් සුදුසු බවත්, එවිට මෙවැනි සංවර්ධන යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් නොවීමට ඉඩ ඇති බවත්, හදිසි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බවත්, ඒ සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය බවත්, ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාර්ග සංවර්ධනය සඳහා මිලියන 16ක මුදලක් පමණක් අයවැයෙන් වෙන් කර ගත හැකි වූ බවත්, රඹුක්කම කොට්ඨාසයේ වසම් 89ක් පවතින බවත්, එක් වසමකට ලක්ෂ 2වත් වැය කළ නොහැකි බවත්, පොදු අරමුදල් වලට අමතරව අමතර ප්‍රතිලාභ ලැබෙන බවත්, එමඟින් සංවර්ධන ව්‍යාපෘති සිදු කළ හැකි බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. අයවැයෙන් වෙන් කරගත් මුදලින් සභාව සතු දේපළ අලුත්වැඩියා කිරීම් සිදුකිරීම සුදුසු බවත්, මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මැදගම කන්ද පාරේ සෝදායාමට ලක්ව ඇති ස්ථානය සඳහා පැතිබැම්මක් ඉදිකිරීමට තීරණය විය.

**(ඊ).03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

i. ''අද ළමා පරපුරෙන් 99% ක්ම මානසික රෝගීන් පමණයි'' සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගෙන්නට, ලස්සන රටක් හදන්න ලස්සන ජීවිතයක් ගත කරන්නට නම් ළමා පරපුර අසහායකරණය සමාජ මාධ්‍ය ජාලයන්ගෙන, මත්ද්‍රව්‍ය වලින් බේරා ගන්නා වැඩසටහන් ආරම්භ කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ආර්.ප්‍රදිපා රංජනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුම්**

සංශෝධන සහිතව ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලන ලද අතර ඒ අනුව ''අද ළමා පරපුරෙන් 99% ක්ම මානසික රෝගීන් පමණයි''යන්න''අද ළමා පරපුරෙන් 99% ක් පමණ මානසික රෝගීන්'' ලෙස සංශෝධන විය යුතු බවත්, අද වන විට ළමා පරපුර අධික පීඩනයෙන් යුත් පරපුරක් බවත්, දෙමව්පියන්ට ගුරුවරුන්ට අකීකරු විෂ මත්ද්‍රව්‍යවලට, අසභ්‍ය සමාජ මාධ්‍ය නැරඹීමට ඇබ්බැහි වූ ළමා පරපුරක් මේ වන විට ගොඩනැගෙමින් පවතින බවත් ළමා පරපුර ආරක්ෂා කර ගැනීමට කුමන හෝ ආකාරයකින් සභාවක් හැටියට මැදිහත් වී කටයුතු කිරීම සුදුසු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී. තවද,

- ✓ මානසික නිදහස සෙවීම.
- ✓ පීඩාකාරී අධ්‍යාපන ක්‍රමවේදය.

- ✓ ක්‍රීඩාවලට යොමු නොවීම.
- ✓ දහම් අධ්‍යාපනය ගිලිහී යාම. ආදිය ළමා සමාංජය මෙසේ මානසික රෝගීන් වීමට හේතුන් ලෙස දැක්විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහනක් පාසල් මට්ටමින් පැවැත්වීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය**
වසම් මට්ටමින් දුරකථනයට හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පිරිමි දරුවන් මෙන්ම ගැහැණු දරුවන්ද සිටින බවත්, ඔවුන්ට කිසියම් වෘතිය අධ්‍යාපනයක් ලබාදීම ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මම යෝජනාව සම්බන්ධව ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලෙසත්, ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට තීරණය විය.

ii. දිට්වා සුළුකුණාටුවෙන් පසු මා ඔය දිය නෑමට භාවිතා කළ ස්ථානයන්ද ඉවුරු කැඩී ඔය ගැඹුරු වී වලවල් සෑදී අනතුරුදායක ස්ථාන බවට පත්ව ඇති හෙයින් එම ස්ථාන නිරීක්ෂණය කර අනතුරු ඇඟවීමේ දැන්වීම් පුවරු සවිකිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුම්**
මා ඔය ගැඹුරු වී ඇති බවත්, අවදානම් සහිත ස්ථානවල අවදානම් බව දන්වා පුවරු සවිකිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අනතුදායක ස්ථාන හඳුනාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
ග්‍රාමසේවක මහතුන්ගේ සහයෝගය ලබාගෙන එම ස්ථාන හඳුනාගත හැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය**
බොහෝ ප්‍රදේශවල කිඹුලන්ද සිටින බැවින් දැන්වීම් පුවරු සවිකිරීම වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
තම තමන්ගේ මට්ටමින් අනතුරුදායක තැන් පිළිබඳ හඳුනාගැනීමේ සංඥා ලකුණු කරන ලෙසත්, ටෙන්ඩර් ක්‍රමවේදයකට ගොස් අදාල පුවරු ලබාගැනීමට කාලයක් ගතවන බව දන්වා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය**
මා ඔය ආශ්‍රිතව අවදානම් සහිත ස්ථාන පිළිබඳව ලිපියක් සභාපතිතුමන් හට ලබාදී ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අවදානම් ස්ථාන හඳුනාගෙන සංඥා පුවරු සවිකිරීමට තීරණය විය.

**(ඊ).04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

i. සතිපොළ තුළ ඇති වෙළෙඳ කුටි විධිමත්ව අංක කරණය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

සතිපොළ භූමියට අදාලව තක්සේරුවක් පවතින බවත්, විධිමත් වෙළඳ කුටි නොමැති බවත්, කඩ කාමර හඳුනා ගැනීමේ ප්‍රශ්නයක් පවතින බවත්, දෛනිකව වෙළඳාමේ නියුතු වූ වෙළෙන්දන් ප්‍රමාණය සම්බන්ධව නිල ගණනය කිරීමක් සිදුකළ නොහැකි බවත්, ප්‍රකාශ කරන ලදී.

සභා සර්භයේ ඝෝෂා

- 12.53ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිණිය සභා ගර්භයෙන් පිටව යන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

වෙළඳ කුටි නිසි ලෙස අංක කිරීම සුදුසු බවත්, අනවසර වෙළඳ කුටි පවතින බවත් සතිපොළ භූමිය ක්‍රමවත් වීමත් ඉන් අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කළ යුතු කාර්යක් බැවින් පත්මසිරි මන්ත්‍රීතුමා සහ ප්‍රියන්ත මන්ත්‍රීතුමා එක්ව එම කඩ හඳුනාගෙන කාර්යාලයේ කාර්මික නිලධාරී මහතුන්ගේ සහයෝගය ද ලබාගෙන ඉදිරි සභා වාරයේදී ගත් ක්‍රියාමාර්ගය ඉදිරිපත් කරන ලෙසත්, මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

කාර්යාලයේ කාර්මික නිලධාරී මහතුන්ගේ සහයෝගය ද ලබාගෙන පත්මසිරි මන්ත්‍රීතුමා සහ ප්‍රියන්ත මන්ත්‍රීතුමා එක්ව සතිපොළ තුළ ඇති වෙළෙඳ කුටි විධිමත්ව අංක කරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගය හදුනාගෙන ඉදිරි සභා වාරයේදී ඉදිරිපත් කිරීමට තීරණය විය.

ii. සතිපොළ භූමියේ නවතා ඇති වෙළෙඳුන්ගේ හා පාරිභෝගිකයන්ගේ වාහන රථගාල තුළට යොමු කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා**

නිසි ලෙස රථවාහන රථගාල වෙත යොමු කිරීම මඟින් බාධාවකින් තොරව වෙළඳාම් කිරීමට හා පාරිභෝගිකයන්ට පහසුවෙන් එයා මෙහා යාමට හැකියාව ලැබෙන බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා මැතිතුමා**

ඒකාධිකාරයක් පවතින බවට වෙළෙඳුන් චෝදනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රථ ගාල වෙත වාහන යොමු කිරීමට සැමගේ සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලද අතර, මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

සතිපොළ භූමියේ නවතා ඇති වෙළෙඳුන්ගේ හා පාරිභෝගිකයන්ගේ වාහන රථගාල තුළට යොමු කිරීමට තීරණය විය.

**(ඊ).05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය**

i. ප්‍රාදේශීය සභාව සතු පොදු ළිං අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය**

එතුමියගේ කොට්ඨාශයේ පොදු ළිං 05 ක් පවතින බවත්, ඉන් 02 ක් භාවිතයට ගන්නා බවත්,නමුත් වර්ෂා කාලයේදී වල් වතුර ළිං ජලයට මුසුවන බැවින් හැකි ඉක්මනින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. තවද, මාරුක්වතුර වසමට මාසකට එක් වතාවක් හෝ කුණු ට්‍රැක්ටරය යැවීමට හැකි නම් ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභාව සතු පොදු ළිං අලුත්වැඩියා කිරීමට තීරණය විය.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය**

වතු නිවාස පවතින බැවින් මසකට එක් වතාවක් හෝ කුණු ට්‍රැක්ටරය යැවීමේ යෝජනාව ක්‍රියාත්මක කළ හැකි නම් වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පොලිතින්
ප්ලාස්ටික්
වීදුරු බෝතල්
වශයෙන් වෙන් කළයුතු බවත්,එමෙන්ම දිනපතා එයකළ නොහැකි බවත්,නොදිරන කසල එක් රැස් කිරීමට කටයුතු සිදුකරන බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ප්‍රාදේශීය සභාව සතු පොදු ළිං අලුත්වැඩියා කිරීමට තීරණය විය.

**(ඊ).06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

i. මංගලගම - කටුහේන මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහමමදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

මංගලගම - කටුහේන මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය සිදු කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මංගලගම - කටුහේන මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට තීරණය විය.

- පෙ.ව.12.12 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා සභා ගර්භයෙන් පිටත්ව යන ලදී.

ii. කුඹල්දීවල, බොරළුව මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධන කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**
කුඹල්දීවල, බොරළුව මාර්ගයේ පොඩි කොටසක් සංවර්ධන කිරීමට ඇති බැවින් එම කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධන සිදු කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.
තීරණය -

කුඹල්දීවල, බොරළුව මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධන කිරීමට තීරණය විය.

iii. කවුඩාඋල්ල, පොල්වත්ත අසලින් කෝන්ගස්ගොඩැල්ල දක්වා දිවෙන මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් යොදා සංවර්ධන කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**
කවුඩාඋල්ල, පොල්වත්ත අසලින් කෝන්ගස්ගොඩැල්ල දක්වා දිවෙන මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් යොදා සංවර්ධන කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.
❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
කවුඩාඋල්ල, පොල්වත්ත අසලින් කෝන්ගස්ගොඩැල්ල දක්වා දිවෙන මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් යොදා සංවර්ධන කිරීමට තීරණය විය.

**(ඊ).07.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

i. පත්තම්පිටිය උප නගරයේ මහජන පුස්තකාලයක් හා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක් ආරම්භ කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
රඹුක්කන විවිධ සේවා සමූපකාර සමිතියට අයත් ගොඩනැගිලි දෙකක් පවතින බවත්,ඉන් එක් ගොඩනැගිල්ලක් සභාවට පවරාගෙන මෙම කටයුතු සිදු කළ හැකි නම් ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**
පුස්තකාලයක් හා ආයුර්වේදයක් මෙම ප්‍රදේශයේ ස්ථාපිත කිරීම ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ක්‍රියාත්මක කිරීමට උත්සාහයක් ගැනීමට තීරණය විය. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

පත්තම්පිටිය උප නගරයේ මහජන පුස්තකාලයක් හා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක් ආරම්භ කිරීමට මුලික අඩිතාලම තැබීමට තීරණය විය.

- ප:ව.1: 09 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා පිටත්ව යන ලදී.

ii. අප ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මිහිදන් කරන වේලාවන් වන ප.ව.2:00, ප.ව.4:00 සහ ප.ව.6:00 එය ප.ව.3:00, ප.ව.5:00 සහ ප.ව.7:00 යනුවෙන් සංශෝධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
ආගමික කටයුතු සිදුකිරීමට යාමේදී ප:ව:2:00 වෙලාව ගැටලු සහගත බවත් පැහැදිලි කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය මැතිතුමිය**
මෙම යෝජනාව කාලෝචිත බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
පරිපාලනමය ගැටලුවකට මුහුණ දීමට සිදුවන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**
ප්‍රායෝගික ගැටලු රැසකට මුහුණ දීමට සිදුවන බැවින් පවතින වේලාවන් හොඳ බවත්,ඊළඟ වර්ෂයේ සිට මෙම වේලාවන් වෙනස් කිරීමට කටයුතු කරන බව මුලින් දැනුවත් කිරීම සිදුකළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.
❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ප:ව:4:00, 6:00 ට ප්‍රමුඛතාවය ලබාදීමටත්,අවශ්‍ය වුවහොත් පමණක් ප:ව:2:00 ලබාදීමටත් සුදුසු බවත් මෙම යෝජනාව පසුවට ක්‍රියාත්මක කිරීමට තීරණය විය. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
මෙම යෝජනාව පසුවට ක්‍රියාත්මක කිරීමට තීරණය විය

**(ඊ).08.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

i. කිරිවල්ලාපිටිය පොදු සුසාන භූමියේ දේහයන් මිහිදන් කරන කොටසේ මාර්ගය ආසන්නයේ දැනුවත් කිරීමේ පුවරුවක් සවි කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
පොලිතින් විශාල ප්‍රමාණයක් භාවිතා කරන බවත්, විශාල වශයෙන් පරිසර හානියක් සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**
අකටයුතුකම් රැසක් වන ස්ථානයක් බවත්, වැට මායිම් ලකුණු කර සීමා නිර්ණය කළ යුතු බවත්,පොලිතින් තහනම් කළ යුතු බවත්,ගේට්ටුවක් දමා ආරක්ෂාව තහවුරු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.
අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
කිරිවල්ලාපිටිය පොදු සුසාන භූමියේ දේහයන් මිහිදන් කරන කොටසේ මාර්ගය ආසන්නයේ දැනුවත් කිරීමේ පුවරුවක් සවි කිරීමට තීරණය විය.

ii. කඩිගමුව බිංගෙය දෙපස එම බිංගෙයෙන් ගමන් කරන කළ හැකි උස ප්‍රමාණය දැක්වෙන පුවරු දෙකක් සවිකිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **ජී.ජී.උපාලි** රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
හතරලියද්ද නුවර හන්දිය,කඩිගමුව හන්දිය වැනි ස්ථානවල දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**
බිංගෙය කඩා ඉවත් නොකරන ලෙස ඉල්ලීමක් කරන ලදී. විකල්ප මාර්ගයක් නිර්මාණය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
RDA හරහා කර ගැනීමට ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත දැනුවත් කිරීම සිදුකිරීම සුදුසු බවත්,මෙම මාර්ග ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදාළ ආයතනය දැනුවත් කිරීමට තීරණය විය. මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
කඩිගමුව බිංගෙය දෙපස එම බිංගෙයෙන් ගමන් කරන කළ හැකි උස ප්‍රමාණය දැක්වෙන පුවරු දෙකක් සවි කිරීම සඳහා අදාළ ආයතනය දැනුවත් කිරීමට තීරණය විය.

## යථා පරිදි කල් දී නොමැති යෝජනා
## (ඊ).01.II.01

රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් ශ්‍රවණාගාර සංකීර්ණය ඉදිකිරීම කර්මාන්තයේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- 2025.12.14 දින සිට 2026.03.14 දක්වා සභා අනුමැතියට යටත්ව දින දීර්ඝ කර ඇත.
- 2026.03.14 දින සිට 2026.06.14 දින දක්වා දින දීර්ඝ කර ගැනීමට අවශ්‍යව ඇත.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් ශ්‍රවණාගාර සංකීර්ණය ඉදිකිරීම කර්මාන්තයේ කොන්ත්‍රාත් කාලය 2025.12.14 දින සිට 2026.06.14 දින දක්වා දින දීර්ඝ කිරීමට තීරණය විය.

## (ඊ).01.II.02

2025.12.31න් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන (අවසන් ගිණුම) මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2025.12.31න් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනට (අවසන් ගිණුම) මහසභා අනුමැතිය ලබාදීමට තීරණය විය.

## (ඊ).01.II.03

රඹුක්කන ප්‍රාදේශීය ලේකම්ගේ KEG/RBK/FYK/OISPO/D116/01 හා 2026.02.24 දිනැති ලිපියෙන් 50 වන ක්‍රීඩා උළෙලට අනුබද්ධව රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අන්තර් ක්‍රීඩා සමාජ I වන අදියර සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ක්‍රීඩාපිටි පහත සඳහන් පරිදි දින වල නොමිලයේ ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.2026.03.01 දින අශෝක ක්‍රීඩාපිටිය නොමිලේ ලබා දී ඇති අතර ඒ සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීමටත්,
අශෝක ක්‍රීඩාපිටිය 2026.03.27 දින නොමිලේ ලබාදීමටත්,බතඹුරය ක්‍රීඩාපිටිය 2026.03.07 හා 2026.04.05 දින 02ක නොමිලේ ලබාදීමටත්, මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
බවුසරය නොමිලයේ ලබා ගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මහජන ක්‍රීඩා පිටි දෙකක් වන බැවින් හා ප්‍රදේශයේ තරුණ/තරුණියන් මේ සඳහා සහභාගී වන බැවිනුත් ජාතික ක්‍රීඩා උළෙලට ක්‍රීඩකයින් තෝරා ගැනීමට බැවිනුත් නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා ඇති බව ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ජාතික 50 වන ක්‍රීඩා උළෙලට අනුබද්ධව රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අන්තර් ක්‍රීඩා සමාජ I වන අදියර සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාපිටි ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව පහත දිනයන් සඳහා නොමිලේ ලබා දීමට තීරණය විය.

| අශෝක ක්‍රීඩාපිටිය | බතඹුරය ක්‍රීඩාපිටිය |
|---|---|
| 2026.03.01 | 2026.03.07 |
| 2026.03.27 | 2026.04.05 |

- ප : ව:01:32 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා පිටත්ව යන ලදී.
- ප : ව:01:32 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුක්මන් මන්ත්‍රීතුමා, ගරු ප්‍රාදේශයේ සභා මන්ත්‍රී අනීස් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි මල්ලිකා මැතිතුමිය පිටත්ව යන ලදී.

## (ඊ).01.II.04

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ රඹුක්කන පොදු වැසිකිළිය ඉදිකිරීම (අලුත්වැඩියා කිරීම) ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තිරණය අනුව ගෙනුක පිල්වර්ස් වෙත පිරිනැමීමට මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ රඹුක්කන පොදු වැසිකිළිය ඉදිකිරීම (අලුත්වැඩියා කිරීම) ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තිරණය අනුව ගෙනුක පිල්වර්ස් වෙත පිරිනැමීමට තීරණය විය.

**(ඊ).01.II.05**

2026 සභා අරමුදල් යටතේ හඟවෙල දේවස්ථාන මාර්ගයට බැකෝ යන්ත්‍ර පැය 05ක් යෙදවීම සඳහා සකස් කළ හගවෙල දේවස්ථාන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වන රු.28,500.00ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 සභා අරමුදල් යටතේ හඟවෙල දේවස්ථාන මාර්ගයට බැකෝ යන්ත්‍ර පැය 05ක් යෙදවීම සඳහා සකස් කළ රු.28,500.00ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**(ඊ).01.II.06**

2026 පොදු අරමුදල් යටතේ තල්දැව ගම මැද මාර්ගයේ ආරම්භ කොටස සංවර්ධනය කිරීම සඳහා වන රු.980,000.00ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 පොදු අරමුදල් යටතේ තල්දැව ගම මැද මාර්ගයේ ආරම්භ කොටස සංවර්ධනය කිරීම සඳහා වන රු.980,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**(ඊ).01.II.07**

2026 පොදු අරමුදල් යටතේ අංක 37 මාළු කඩ කාමරය අලුත්වැඩියා කිරීම සඳහා වන රු.120,000.00ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 පොදු අරමුදල් යටතේ අංක 37 මාළු කඩ කාමරය අලුත්වැඩියා කිරීම සඳහා වන රු.120,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**(ඊ).01.II.08**

2026 පොදු අරමුදල් යටතේ අංක 36 මාළු කඩ කාමරය අලුත් වැඩියා කිරීම සඳහා වන රු.132,000.00ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 පොදු අරමුදල් යටතේ අංක 36 මාළු කඩ කාමරය අලුත් වැඩියා කිරීම සඳහා වන රු.132,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**(ඊ).01.II.09**
2026 පොදු අරමුදල් යටතේ බතඹුරය ක්‍රීඩාංගනයේ වැසිකිළි පද්ධතිය අලුත් වැඩිය කිරීම සඳහා වන රු.16,695.00ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 පොදු අරමුදල් යටතේ බතඹුරය ක්‍රීඩාංගනයේ වැසිකිළි පද්ධතිය අලුත් වැඩිය කිරීම සඳහා වන රු.16,695.00ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**(ඊ).01.II.10**
2026 සභා අරමුදල් යටතේ බංගලාවත්ත පළමු පටු මග මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වන රු.780,000.00ක ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 සභා අරමුදල් යටතේ බංගලාවත්ත පළමු පටු මග මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වන රු.780,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**(ඊ).01.II.11**
2026 පොදු අරමුදල් යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභා අදාහනාගාරයේ ඉදිරිපස මිදුලේ ඉන්ටලොක් (Interlock) ගල් ඇතිරීම සඳහා වන රු.480,000.00ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභා අදාහනාගාරයේ ඉදිරිපස මිදුලේ ඉන්ටලොක් (Interlock) ගල් ඇතිරීම සඳහා වන රු.480,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**(ඊ).01.II.12**

2026 පොදු අරමුදල් යටතේ රඹුක්කන නගරයේ පොදු ක්‍රීඩා පිටිය (ජාකොබ් වත්ත) අසල කාණු පද්ධතිය පිළිසකර කිරීම සඳහා වන රු.34,800.00 ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ රඹුක්කන නගරයේ පොදු ක්‍රීඩා පිටිය (ජාකොබ් වත්ත) අසල කාණු පද්ධතිය පිළිසකර කිරීම සඳහා වන රු.34,800.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**(ඊ).01.II.13**

2026 පොදු අරමුදල් යටතේ පින්නවල වසමේ පොල්පිටිය මහතාගේ නිවස ඉදිරිපිට සිට හඳගම මාර්ගය දක්වා මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන රු.450,000.00 ක ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ පින්නවල වසමේ පොල්පිටිය මහතාගේ නිවස ඉදිරිපිට සිට හඳගම මාර්ගය දක්වා මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන රු.450,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**(ඊ).01.II.14**

2025 සභා අරමුදල් වලින් වියදම් දැරීමට අනුමැතිය ලබා ගත් රුපියල් මිලියන 3.5ක් වටිනා ඇස්තමේන්තුවට නව වැඩ අයිතමයන් ඇතුලත් කිරීම හේතුවෙන් එය රුපියල් මිලියන 4.9ක් දක්වා සංශෝධනය විය.

- 2025 සභා අරමුදල් වලින් රුපියල් මිලියන 3.5ක් දැරීමටත්,
- 2026 සභා අරමුදල් වලින් රුපියල් මිලියන 1.4ක් දැරීමටත්,
- එම සංශෝධන ඇස්තමේන්තුව සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීමටත් ,

සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව විරුද්ධත්වයක් හෝ ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2025 සභා අරමුදල් වලින් වියදම් දැරීමට අනුමැතිය ලබා ගත් රුපියල් මිලියන 3.5ක් වටිනා ඇස්තමේන්තුවට නව වැඩ අයිතමයන් ඇතුලත් කිරීම හේතුවෙන් එය රුපියල් මිලියන 4.9ක් දක්වා සංශෝධනය විය.ඒ අනුව

- 2025 සභා අරමුදල් වලින් රුපියල් මිලියන 3.5ක් දැරීමටත්,
- 2026 සභා අරමුදල් වලින් රුපියල් මිලියන 1.4ක් දැරීමටත්,
- එම සංශෝධන ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීමටත් තීරණය විය.

(උ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවේලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස, ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම. - නැත

(ඌ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 10 වරිපනම් බදු | 4,273,544.17 | 90,600.00 | - | - | - | 4,364,144.17 |
| 20 කුලී | - | 21,705.00 | 803,906.96 | 1,146,450.50 | 173,000.00 | 2,145,062.46 |
| 30 බලපත්‍ර සේවා | 19,644.00 | 44,000.00 | 420,830.00 | - | - | 484,474.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 13,750.00 | 532,810.54 | 378,427.76 | - | 1,555.00 | 926,543.30 |
| 50 වරෙන්තු සඳහා ගාස්තු | 3,310.00 | - | - | 103,781.00 | 1,458.00 | 108,549.00 |
| 60 වෙනත් ආදායම් | 71,304.17 | 81,550.00 | 131,300.00 | - | 710.00 | 284,864.17 |
| 70 වෙනත් ආදායම් | - | - | - | - | - | - |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **4,381,552.34** | **770,665.54** | **1,734,464.72** | **1,250,231.50** | **176,723.00** | **8,313,637.10** |
| ප්‍රාග්ධන ආධාර 3-80 | - | - | - | - | - | - |
| එකතුව | - | - | - | - | - | - |
| **පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් වල එකතුව** | **4,381,552.34** | **770,665.54** | **1,734,464.72** | **1,250,231.50** | **176,723.00** | **8,313,637.10** |
| සේවක ණය | | | | | | - |
| මහජන බැංකුව -සේවක ණය | - | | | | | - |
| ලංකා බැංකුව -සේවක ණය | 851,569.40 | | | | | 851,569.40 |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| මහජන බැංකුව 101-1001-05116620 | - | | | | | - |
| තැන්පත් | 6,409,618.15 | | | | | 6,409,618.15 |
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ශීර්ෂ ආදායම | 21,918.84 | | | | | 21,918.84 |
| අත්තිකාරම් | 3,300.00 | | | | | 3,300.00 |
| ආයෝජන ආපසු ලැබීම් | 51,920,657.53 | | | | | 51,920,657.53 |
| වෙනත් ලැබීම් | 59,333,009.85 | | | | | 59,333,009.85 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මුළු එකතුව | **118,540,073.77** | **770,665.54** | **1,734,464.72** | **1,250,231.50** | **176,723.00** | **126,853,710.87** |

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **5** | **6** | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 01 වැටුප් දීමනා | 3,979,980.00 | 1,707,999.50 | 1,674,372.00 | 61,702.00 | 608,473.00 | 8,032,526.50 |
| 02 ගමන් වියදම් | - | - | - | - | - | - |
| 03 සැපයුම් හා උපකරණ | 56,323.00 | 195,330.00 | 112,770.00 | 16,620.00 | - | 381,043.00 |
| 04 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 15,458.00 | 3,300.00 | 2,450.00 | - | - | 21,208.00 |
| 05 ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා හා වෙනත් සේවා | 741,517.98 | 16,945.28 | - | 6,246.14 | 3,654.07 | 768,363.47 |
| 06 පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | | | - | - | - | - |
| 07 ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 16,342.93 | - | - | - | - | 16,342.93 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 4,709.16 | | - | - | | 4,709.16 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **4,814,331.07** | **1,923,574.78** | **1,789,592.00** | **84,568.14** | **612,127.07** | **9,224,193.06** |
| 09 ප්‍රාග්ධන වැය | - | | | - | - | - |
| 10 ණය ආපසු ගෙවීම් | - | | | - | - | - |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **-** | **-** | **-** | **-** | **-** | **-** |
| **පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වියදම් වල මුළු එකතුව** | **4,814,331.07** | **1,923,574.78** | **1,789,592.00** | **84,568.14** | **612,127.07** | **9,224,193.06** |
| **සේවක ණය** | | | | | | |
| මහජන බැංකුව | 1,134,000.00 | | | | | 1,134,000.00 |
| ලංකා බැංකුව | 851,569.40 | | | | | 851,569.40 |
| ලංකා බැංකුව 8502324 | | | | | | - |
| තැන්පත් | 3,061,507.36 | | | | | 3,061,507.36 |
| විවිධ ණය හිමියෝ | 3,854,108.46 | | | | | 3,854,108.46 |
| ගබඩා ණය හිමියෝ | 192,210.00 | | | | | 192,210.00 |
| අත්තිකාරම් | 606,010.00 | | | | | 606,010.00 |
| සමුච්චිත අරමුදල | 104,057.80 | | | | | 104,057.80 |
| ආයෝජන | 50,000,000.00 | | | | | 50,000,000.00 |
| වෙනත් ගෙවීම් | - | | | | | - |
| මුළු එකතුව | **59,803,463.02** | **1,923,574.78** | **1,789,592.00** | **84,568.14** | **612,127.07** | **69,027,656.08** |

**(එ).සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරිම.**

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
  - බතඹුරේ ක්‍රීඩාංගනයේ වැසිකිලි පහසුකම් ප්‍රමාණවත් නොමැති බවටත්,
  - අශෝක ක්‍රීඩාංගනයට යන මාර්ගයේ වළවල් කිහිපයක් සෑදී ඇති බැවින් එය පිළිසකර කර ගැනීමටත්,
  - නුගවෙල දේවාලය මාර්ගයේ දේවාලය අසලම පවතින විදුලි බල්බය නැවත සවිකර දෙන ලෙසටත් ඉල්ලා ඇති බව ප්‍රකාශ කරන ලදී.
- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බතඹුරය ක්‍රීඩාංගනය ආශ්‍රිත ප්‍රශ්නය මේ වන විට විසඳමින් පවතින බව ප්‍රකාශ කරන ලදී.

**අවසානය**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ස්තුතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.30 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

**සංශෝධන**

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පිටු අංක 25 හි සඳහන් ඊ.07.ii යෝජනාව ඒකමතිකව සහා සම්මත විය ලෙස සටහන් වී ඇති නමුත් එම යෝජනාව සහා සම්මත නොවූ බැවින් එය ඉවත්විය යුතු බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.
පිටු අංක 27 හි සඳහන් ඊ.01.II.04 යෝජනාවේ ගෙනුක පිල්වර්ස් ලෙස සටහන් වුවද එය ගෙනුක බිල්ඩර්ස් විය යුතු බවත්, තීරණයේ ද එය වෙනස් විය යුතු බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඊ.02.II යෝජනාව අතරතුර මාසික සභික දීමනා බෙදීම සිදු වූ බවත් එහිදී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා සහ ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමාගේ සභික දීමනාව නොලැබූ බැවින් ඒ සම්බන්ධව ප්‍රශ්න නැගූ බවත් ඉන් අනතුරව සභා ගර්භයෙන් ඉවත්ව ගිය බවත් එය වාර්තාවේ සටහන් වී නොමැති බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

පිටු අංක 12 හි සඳහන් සභාපතිතුමන්ගේ xiii වන යෝජනාව සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ප්‍රථම එන්.ඒ.ප්‍රේමදාස මහතාට මේ සම්බන්ධව ලිපියකින් දැනුම් දීම සිදුකළ යුතු බව ප්‍රකාශ කළ බවත්, එය වාර්තාවේ සඳහන් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. එසේම ඒකමතිකව සහා සම්මත විය යන්න යෙදීම සුදුසු නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

2026.03.04 දින මාසික මහසභා වාර්තාව සංශෝධන සහිතව සහා සම්මත විය.

සත්‍ය පිටපතකි.

ආර්.එම්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.